# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2011 දෙසැම්බර්

උක්ත විභාගය සඳහා පෙනී සිටීමට අපේක්ෂා කරන සියලුම පාසල් හා පෞද්ගලික අපේක්ෂකයින් වෙනුවෙන් 2011 ජුනි මස 01 දින සිට 30 වන දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි දැක්වෙන ආදර්ශ අයදුම්පත පෞද්ගලික අයදුම්කරුවන් සඳහා පමණි. සෑම පෞද්ගලික අයදුම්කරුවකුම මෙම නිවේදනය සම්පූර්ණයෙන් කියවා හොඳින් අවබෝධ කර ගෙන තම අයදුම්පත සම්පූර්ණ කළ යුතු **ය. අයදුම්පත්‍රයේ නගර අංකය හා විෂය අංක සටහන් කිරීමේ දී නිවැරදි අංකය ම සටහන් කිරීමට විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.**

02. පාසල් අයදුම්කරුවන් සඳහා අයදුම්පත් :
මීට පෙර අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා සිසුන් ඉදිරිපත් කරන ලද රජයේ පාසල් හා අනුමත පිරිවෙන් සඳහා අදාළ අයදුම්පත් 2011.06.01 දින වන විට ලැබෙන පරිදි තැපැල් කර යවා ඇත. මේ වන විටත් යම් පාසලකට මෙම ඉල්ලුම්පත් ලැබී නොමැති නම් නොපමාව මෙම දෙපාර්තමේන්තුවේ පාසල් විභාග සංවිධාන ශාඛාවට ඒ බව දැනුම් දිය යුතු වේ.

| |
|---|
| **පෞද්ගලික අයදුම්කරුවන් ලෙස ඉල්ලුම් කළ හැක්කේ පාසලෙන් අස්වී ඇති අයදුම්කරුවන්ට පමණි. පාසලේ සිටිමින්ම පෞද්ගලික අයදුම්කරුවන් ලෙස ඉල්ලුම් කරන අයදුම්කරුවන් විභාග තහනමකට ලක් කෙරෙනු ඇත.** |

03. **පෞද්ගලික අයදුම්කරුවෝ :**

රජයේ පාසලක, ගාස්තු අය නොකරන අනුමත පාසලක හෝ පිළිගත් පිරිවෙනක හෝ ඉගෙනීම නොලබන කෙනෙකුට අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා පෞද්ගලික අයදුම්කරුවකු ලෙස ඉල්ලුම් කළ හැකිය. මෙම විභාගය සඳහා පෞද්ගලික අයදුම්කරුවන්ගෙන් 2011 **ජුනි මස** 30 වැනි දින තෙක් අයදුම්පත් භාරගනු ලැබේ.

04. **විභාගයට පෙනී සිටීම සඳහා පෞද්ගලික අයදුම්කරුවන් තම ස්ථිර පදිංචි ස්ථානයට ආසන්න නගරය තෝරා ගත යුතුයි.**

05. මෙම දැන්වීමෙහි ඇති ආදර්ශ අයදුම්පතට අනුකූලව තම තමන්ගේ අයදුම්පත් අයදුම්කරුවන් විසින්ම පිළියෙල කරගත යුතු ය.

06. අයදුම්පත් සෙ.මී.28 x 21 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර ගත යුතු අතර, අංක 01 සිට 12 දක්වා කොටු මුල් පිටුවේ ද, අංක 13 සිට 14 දක්වා කොටු පසු පිටුවේ ද ඇතුළත් වන සේ අයදුම්පත සකස් කර ගත යුතු ය.

07. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් " විභාග කොමසාරිස් ජනරාල්, පාසල් විභාග සංවිධාන ශාඛාව, තැ.පෙ. 1503, කොළඹ " යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරෙහි,

**අ.පො.ස.(සා.පෙළ) දෙසැම්බර්** 2011 යන්න හා **" නගර අංකය ……………"** ද සඳහන් කරන්න.

08. එක් අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණි. **යම් අයදුම්කරුවකු එක් අයදුම්පතකට වඩා ඉදිරිපත් කළහොත් විභාග අපේක්ෂකත්වය හෝ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු සියලුම විභාග ප්‍රතිඵල හෝ අවලංගුවන බව තරයේ දැන සිටිය යුතුය. එසේම දීර්ඝ කාලීන විභාග තහනමකට ද ලක්විය හැකිය.** තවද, එක කවරයක අඩංගු කළ යුත්තේ එක අයදුම්පතක් පමණි. අයදුම්පත් නිවැරදිවත් පැහැදිලිවත් තමාගේ අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතු අතර, ඒ සඳහා දී ඇති උපදෙස් තරයේ අනුගමනය කළ යුතු ය.

09. වෙනත් ආයතන/පුද්ගලයින් විසින් සකස් කොට ඇති ආකෘති පත්‍ර මේ සඳහා භාවිත කරනු ලැබුව ද මෙම දැන්වීමේ පහතින් දක්වා ඇති විෂය අංක හා නගර අංක ම නිවැරදිව සඳහන් කරන්න. **ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමට පෙර නැවත වරක් කියවා එහි දක්වා ඇති අංක හා අනෙක් විස්තර මෙම දැන්වීමේ ප්‍රකාරව නිවැරදි දැයි බලන්න.**

10. **අනන්‍යතාව ඔප්පු කිරීම:**

අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රවලට ඉදිරිපත්වීම සඳහා විභාග ශාලාවට පැමිණෙන සෑම අවස්ථාවකදීම තම අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා පහත දැක්වෙන හැඳුනුම්පත් වලින් එකක් ඉදිරිපත් කළ යුතු වේ.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය ( පාස්පෝට් )

11. **විභාග ගාස්තු :**

**රජයේ පාසැල් වලින්, ගාස්තු අය නොකරන පෞද්ගලික පාසල් වලින් හෝ පිලිගත් පිරිවෙන් වලින් ඉදිරිපත් කෙරෙන අයදුම්කරුවන් හැර අනෙකුත් සියලුම අයදුම්කරුවන් නියමිත විභාග ගාස්තු ගෙවිය යුතුවේ.**

තැපැල් කාර්යාලයකට හෝ උප තැපැල් කාර්යාලයකට හෝ නියමිත විභාග ගාස්තුව ගෙවා කුවිතාන්සියක් ලබාගත යුතු ය. ගාස්තුව ගෙවන ලද කුවිතාන්සිය ඉල්ලුම්පතේ අදාළ කොටුවේ අලවා එවිය යුතු ය. මුදල් ඇණවුම් භාරගනු නොලැබේ. ( එහි ජායා පිටපතක් හා ඉල්ලුම් පත ලියාපදිංචි කළ රිසිට් පත අයදුම්කරු ලඟ තබා ගත යුතුය.)

**විශේෂයෙන් සැළකිය යුතුයි :**

(අ) මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තු සම්පූර්ණයෙන් හෝ අඩක් හෝ ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක ගාස්තුව වශයෙන් මාරු කිරීම හෝ කරනු නොලැබේ.

(ආ) ඉල්ලුම්පත එවීමෙන් පසු නගර අංකය හෝ විෂය අංක හෝ මාරු කරනු නොලැබේ.

(ඇ) ඉල්ලුම්පත් කැඳවීම අවසන් කරන දිනට පසුව තැපැල් කාර්යාල වලට මුදල් ගෙවා ඇති ඉල්ලුම්පත්‍ර සහ අවසාන දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ඈ) දෙවන විෂය කාණ්ඩයට අයත්
(40) සංගීතය (පෙරදිග)
(41) සංගීතය (අපරදිග)
(42) සංගීතය (කර්ණාටක)
(44) නැටුම් (දේශීය)
(45) නැටුම් (භරත)
(50) නාට්‍ය හා රංග කලාව (සිංහල)
(51) නාට්‍ය හා රංග කලාව (දෙමළ)
(52) නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි)

යන විෂයයන් සඳහා අයදුම් කරන අපේක්ෂකයන් ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටිය යුතු වේ. අවසන් ප්‍රතිඵලය ලබා දෙනු ලබන්නේ ලිඛිත හා ප්‍රායෝගික යන කොටස් දෙක සඳහාම පෙනී සිටි අපේක්ෂකයින්ට පමණි.

**අනුර එදිරිසිංහ**
**විභාග කොමසාරිස් ජනරාල්**

6/4/2011/1
පාසල් විභාග සංවිධාන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1503, කොළඹ.

2011 මැයි මස 30 වැනි දින.

E:\U.A\6.4\2011 Privet P.doc

ආදර්ශ අයදුම් පත්‍රය

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය -2011 දෙසැම්බර්

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

01. තෝරාගත් නගරය සහ නගර අංකය :

නගරය :........................ නගර අංකය [ ]

(විභාගයට පෙනී සිටීම සඳහා පෞද්ගලික අයදුම්කරුවන් තම ස්ථිර පදිංචි ස්ථානයට ආසන්න නගරය තෝරා ගත යුතු ය.)

02. අයදුම්කරුගේ සම්පූර්ණ නම (උපදෙස් පත්‍රිකාවේ අංක 02 බලන්න)

1. ඉංග්‍රීසියෙන් (කැපිටල් අකුරින්)

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |

2. සිංහලෙන් ....................................................................................................................................

.......................................................................................................................................................

03. ලිපිනය : ඉංග්‍රීසියෙන්(කැපිටල් අකුරින්) සිංහලෙන්

………………………………… ………………………………………..........

………………………………… ………………………………………..........

………………………………… ………………………………………..........

………………………………… ………………………………………..........

04. ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ [0] ස්ත්‍රී [1]

05. උපන් දිනය : වර්ෂය :………………… මාසය :…...........……… දිනය :…....………

06. ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

07. දුරකථන අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

08. භාෂා මාධ්‍යය : සිංහල [2] දෙමළ [3] ඉංග්‍රීසි [4]

09. ගෙවන ලද විභාග ගාස්තුව රු: ……….......................…… වචනයෙන් රුපියල් :………….......…….

I. කුවිතාන්සි අංකය :……………................… II. දිනය :…………............…… .

III. ගෙවූ තැපැල් කාර්යාලය :……..............................

10. ඉල්ලුම් කරන විෂයයන් ගණන - [ ]

11. **ඉල්ලුම් කරන විෂයයන් විෂය අංකය**

01 ……...........……….............. [ ]

02 …...................……….....…… [ ]

03 ………….................………. [ ]

04 ……………..........……...…. [ ]

05 ……….................……...…. [ ]

06 ……..........................……... [ ]

**පළමු විෂය කාණ්ඩය විෂය අංකය**

07 …………….................... [ ]

**දෙවන විෂය කාණ්ඩය**

08 ……………........…...…. [ ]

**තෙවන විෂය කාණ්ඩය**

09 ………….......….....……. [ ]

12. අයදුම්කරුගේ සහතිකය:

මෙම ඉල්ලුම් පත්‍රයේ දක්වා ඇති සියලුම තොරතුරු නිවැරදි හා සත්‍ය බව ද මෙම විභාගය පිළිබඳව ව්‍යවස්ථාවන්ට හා අයදුම්කරුවන් සඳහා පනවා ඇති නීතිරීති වලට එකඟ වන බව හා ඉන් බැඳී සිටින බව ද විභාගය සම්බන්ධ ව විභාග කොමසාරිස් ජනරාල් විසින් ගනු ලබන තීරණවලට එකඟ වන බව ද මෙයින් ප්‍රකාශ කරමි.

දිනය :- ............................ ……………........……….

අයදුම්කරුගේ අත්සන

13. **කුවිතාන්සියේ මුල් පිටපත නොගැලවෙන පරිදි මනාව අලවන්න. එහි ජායා පිටපතක් ඔබ ළඟ තබා ගන්න. කුවිතාන්සියේ මුල් පිටපත අලවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

| විෂයය ගණන | 1 | 2 | 3 | 4 | 5 | සිට දක්වා 6 - 09 |
|---|---|---|---|---|---|---|
| ගාස්තුව | රු:50/= | රු:60/= | රු:70/= | රු:80/= | රු:90/= | රු: 125/= |

**මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සියේ මුල් පිටපත නොගැලවෙන පරිදි මනාව මෙහි අලවන්න. එහි ජායා පිටපතක් ඔබ ළඟ තබාගන්න.**

14. **අත්සන සහතික කිරීම :**

අත්සන සහතික කරන අය ඉදිරියේ දී ම අයදුම්කරු විසින් ඉල්ලුම් පත්‍රයේ අත්සන තැබිය යුතු ය. අත්සන සහතික කරන අය විසින් ම ජාතික හැඳුනුම්පතේ අංකයත්, උප්පැන්න සහතිකයේ දැක්වෙන උපන් දිනයත් අයදුම්පතේ ලිවිය යුතු ය.

(අ) මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන................................................ අයදුම්කරු/කාරිය මම පෞද්ගලිකව හඳුනමි.

(ආ) ඔහුගේ/ඇයගේ උප්පැන්න සහතිකය අනුව උපන් දිනය ........................................ බවත්, එම උප්පැන්න සහතිකයේ අංකය ................................................ බවත් ඔහුගේ/ඇයගේ ජාතික හැඳුනුම්පත් අංකය ................................................ බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් තබන ලද බවත් සහතික කරමි.

................................................
අයදුම්කරුගේ අත්සන.

(අයදුම්කරුගේ ලිපිනය) ................................................................................................

................................................................................................

සහතික කරන ග්‍රාම නිළධාරීගේ අත්සන ................................................................

සහතික කරන ග්‍රාම නිළධාරීගේ නම ................................................................................................

ග්‍රාම නිළධාරී වසම හා එහි අංකය ................................................................................................

(තනතුරට අදාළ නිල රබර් මුද්‍රාව තබන්න)

ලිපිනය ................................................................................

................................................................................................

දිනය :...............

E:\nU.A\n6.4\n2011 PrivetP.doc

## අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

01. විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලබන පහත දක්වා ඇති නගර නාම ලේඛනයෙන් තමන් තෝරාගත් නගරය හා නගර අංකය පැහැදිලිව මේ කොටුවේ ලියන්න. තමාගේ ස්ථිර පදිංචි ස්ථානයට ආසන්න නගරය තෝරා ගන්න. (සෑම නගරයකටම අංකයක් දී ඇත)

02. සම්පූර්ණ නම **(ඉංග්‍රීසි කැපිටල් අකුරින් හා සිංහලෙන් ලියන්න)**

**උදාහරණ :** (අ) MALAGE CHAMARA JAYASINGHE
(ආ) **මාලගේ චාමර ජයසිංහ**

03. සම්පූර්ණ ලිපිනය **(ඉංග්‍රීසි කැපිටල් අකුරින් හා සිංහලෙන් ලියන්න)**

**උදාහරණ :** (අ) ඉංග්‍රීසියෙන් : GALKULAMA , ANURADHAPURA
(ආ) සිංහලෙන් : ගල්කුලම, අනුරාධපුරය

04. අදාළ කොටුවේ කතිර ලකුණ යොදන්න පිරිමි **0** ගැහැණු **1** (කතිර ලකුණ සහිතව)
උදාහරණ : **ගැහැණු** අයදුම්කරුවෙකු නම්

05. උප්පැන්න සහතිකයේ දැක්වෙන පරිදි ඔබගේ උපන් දිනය ලියන්න.
වර්ෂය……………………මාසය ………………….දිනය ………………

06. ජාතික හැඳුනුම්පත් අංකය පමණක් ලියන්න. (තැපැල් හැඳුනුම්පතේ හෝ විදේශ ගමන් බලපත්‍රයෙහි අංකය **නොලියන්න**.)

07. අයදුම්පතෙහි පවතින අඩුපාඩු සම්බන්ධයෙන් විමසීමට අවශ්‍ය වන අවස්ථාවක භාවිතා කිරීම සඳහා ඔබගේ දුරකථන අංකය මෙහි ලියන්න.

08. අදාළ කොටුවේ කතිර ලකුණ යොදන්න. සිංහල **2** (කතිර ලකුණ සහිතව) දෙමළ **3** ඉංග්‍රීසි **4**

උදාහරණ : **සිංහල මාධ්‍යය අයදුම්කරුවෙකු නම්**

09. **<u>විභාග ගාස්තු :</u>**

(i) විභාග ගාස්තු වශයෙන් නියමිත මුදල තැපැල් කාර්යාලයකට හෝ උපතැපැල් කාර්යාලයකට හෝ ගෙවා ඒ වෙනුවෙන් කුවිතාන්සියක් ලබාගෙන අදාළ විස්තර ඉල්ලුම් පතේ ලියන්න. ( එම කුවිතාන්සියේ ජායා පිටපතක් ද ඔබ වෙත තබා ගන්න)

(ii) එක් විෂයයක් සඳහා රු:50/= (පනහයි), විෂයයන් දෙකක් සඳහා රු: 60/=(හැටයි), විෂයයන් තුනක් සඳහා රු: 70/=(හැත්තෑවයි), විෂයයන් හතරක් සඳහා රු: 80/=(අසූවයි), විෂයයන් පහක් සඳහා රු: 90/=(අනූවයි), විෂයයන් 6 සිට 09 දක්වා රු:125/=(එකසිය විසි පහයි)

10. පෙනී සිටින විෂයයන් ගණන ලියන්න
උදාහරණ : විෂයයන් 09 කට පෙනී සිටින්නේ නම් **09**

11. මෙහි අවසානයට ඇති විෂය ලේඛනය අනුව තමන් පෙනී සිටින **<u>විෂයයන්</u>** හා **<u>විෂය අංක</u>** නිවැරදිව ඇතුළත් කරන්න. **ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන ලද විෂයයන් පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.**

**විෂයයන් තෝරා ගැනීම :**

(අ) පහත දක්වා ඇති සීමාවන්ට යටත්ව අයදුම්කරුවකුට විෂයයන් 09 ක් තෝරාගත හැකිය.

| **විෂය අංක:** | **විෂයයන්:** |
|---|---|
| (11) සිට (16) දක්වා | ආගම |
| (21, 22) | භාෂාව හා සාහිත්‍යය ( (21) සිංහල / (22)දෙමළ) |
| (31) | ඉංග්‍රීසි භාෂාව |
| (32) | ගණිතය |
| (33) | ඉතිහාසය |
| (34) | විද්‍යාව |
| (60) සිට (72) දක්වා | පළමු විෂය කාණ්ඩය |
| (40) සිට (52) දක්වා | දෙවන විෂය කාණ්ඩය |
| (80) සිට (94) දක්වා | තෙවන විෂය කාණ්ඩය |

එක් එක් කාණ්ඩයෙන් එක් විෂයක් බැගින් පමණක් තෝරා ගත යුතුය. විෂය අංක 21 සිංහල භාෂාව හා සාහිත්‍යය ඉල්ලුම් කරන අයදුම්කරුවෙකුට 64 දෙවන භාෂාව (සිංහල) විෂයය ඉල්ලුම් කළ නොහැකිය. එසේම විෂය අංක 22 දෙමළ භාෂාව හා සාහිත්‍යය ඉල්ලුම් කරන අයදුම්කරුවෙකුට 65 දෙවන බස (දෙමළ) විෂයය සඳහා ඉල්ලුම් කළ නොහැක.

12. අයදුම්කරු අත්සන සහතික කරන අය වෙත යන විට උප්පැන්න සහතිකය හා ජාතික හැඳුනුම්පත ද රැගෙන යා යුතු ය. ජාතික හැඳුනුම්පත, ඉල්ලුම් පත්‍රය එවන අවස්ථාවේ දී ලබාගෙන නැති නම් ඒ බව එහි ලියන්න.

13. නියමිත විභාග ගාස්තු තැපැල් කාර්යාලයකට / උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබාගත් කුවිතාන්සිය නොගැලවෙන පරිදි අදාළ කොටුවේ අලවන්න.

14. **අත්සන සහතික කිරීම :**
තමා පදිංචි ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරීවරයා විසින්ම සහතික කළ යුතු අතර ග්‍රාම නිලධාරීවරයාගේ නම, ග්‍රාම නිලධාරී වසම හා එහි අංකය ඇතුලත් කර නිල රබර් මුද්‍රාවක් යොදා සහතික කළ යුතු ය.

15. **දෘෂ්‍යාබාධිත අයදුම්කරුවන් / විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවන් :**
දෘෂ්‍යාබාධිත අයදුම්කරුවෙකු / විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවකු වෙනුවෙන් ඉදිරිපත් කරන අයදුම්පතෙහි වම් පස උඩ කෙළවරේ රතු පාටින් " **දෘෂ්‍යාබාධිත අයදුම්කරුවෙකි / විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවෙකි**" යනුවෙන් සඳහන් කළ යුතුයි.

## විෂය ලේඛනය

- **ආගම්**
  - (11) බුද්ධ ධර්මය
  - (12) ශෛවනෙරි
  - (14) කතෝලික ධර්මය
  - (15) ක්‍රිස්තියානි ධර්මය
  - (16) ඉස්ලාම්

- **භාෂාව හා සාහිත්‍යය**
  - (21) සිංහල භාෂාව හා සාහිත්‍යය
  - (22) දෙමළ භාෂාව හා සාහිත්‍යය

- **(31) ඉංග්‍රීසි භාෂාව**
- **(32) ගණිතය**
- **(33) ඉතිහාසය**
- **(34) විද්‍යාව**

- **පළමු විෂය කාණ්ඩය**
  - (60) ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
  - (61) භූගෝල විද්‍යාව
  - (62) පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය
  - (63) ව්‍යවසායකත්ව අධ්‍යයනය
  - (64) දෙවන භාෂාව (සිංහල)
  - (65) දෙවන භාෂාව (දෙමළ)
  - (66) පාලි
  - (67) සංස්කෘත
  - (68) ප්‍රංශ
  - (69) ජර්මන්
  - (70) හින්දි
  - (71) ජපන්
  - (72) අරාබි

- **දෙවන විෂය කාණ්ඩය**
  - (40) සංගීතය (පෙරදිග)
  - (41) සංගීතය (අපරදිග)
  - (42) සංගීතය (කර්ණාටක)
  - (43) චිත්‍ර
  - (44) නැටුම් (දේශීය)
  - (45) නැටුම් (භරත)
  - (46) ඉංග්‍රීසි සාහිත්‍ය රසාස්වාදය
  - (47) සිංහල සාහිත්‍ය රසාස්වාදය
  - (48) දෙමළ සාහිත්‍ය රසාස්වාදය
  - (49) අරාබි සාහිත්‍ය රසාස්වාදය
  - (50) නාට්‍ය හා රංග කලාව (සිංහල)
  - (51) නාට්‍ය හා රංග කලාව (දෙමළ)
  - (52) නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි)

- **තෙවන විෂය කාණ්ඩය**
  - (80) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
  - (81) කෘෂි හා ආහාර තාක්ෂණය
  - (82) ධීවර හා ආහාර තාක්ෂණය
  - (83) නිර්මාණකරණය හා තාක්ෂණවේදය
  - (84) ශිල්ප කලා
  - (85) ගෘහ ආර්ථික විද්‍යාව
  - (86) සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
  - (87) සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
  - (92) විද්‍යුත් ලේඛනකරණය හා ලඝුලේඛණය (සිංහල)
  - (93) විද්‍යුත් ලේඛනකරණය හා ලඝුලේඛණය (දෙමළ)
  - (94) විද්‍යුත් ලේඛනකරණය හා ලඝුලේඛණය (ඉංග්‍රීසි)

මගේ අංකය : 6/4
පාසල් විභාග සංවිධාන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.
2011.05.

විදුහල්පතිවරුන් / පිරිවේණාධිපති වරුන් වෙත,

## මාධ්‍ය දෙකකින් පෙනී සිටින අයදුම්කරුවන් සඳහා උපදෙස් :

අධ්‍යාපන ලේකම්ගේ 2005/16 චක්‍රලේඛයට අනුව මෙවර අනුමත විෂය කිහිපයක් සඳහා ඉංග්‍රීසි මධ්‍යයෙන් ද සිංහල හෝ දෙමළ මධ්‍යයෙන්ද වශයෙන් මධ්‍යය දෙකකින් පෙනී සිටීමට පහසුකම් සලසා ඇත. එවැනි අයුදම්කරුවන් වෙනුවෙන් විශේෂ අයදුම් පත්‍රයක් එවා ඇති අතර, අදාළ වන වෙනත් පාසල් ප්‍රධානීන් වේ නම් විභාග දෙපාර්තමේන්තුවේ පාසල් විභාග සංවිධාන ශාඛාවෙන් අදාළ ඉල්ලුම්පත්‍ර ලබාගත යුතුය.

02. එම ඉල්ලුම්පත්‍රයේ වෙනමම මාධ්‍ය තීරුවක් හා විෂය අංක තීරුවක් වෙන්කර ඇත. එම මාධ්‍ය තීරුවේ සිංහල මාධ්‍යය විෂයන් සඳහා අංක 02, දෙමල මාධ්‍යය විෂයන් සඳහා අංක 03 සහ ඉංග්‍රීසි මාධ්‍යය විෂයන් සඳහා අංක 04 යොදන්න.

උදාහරණ:-

| | මාධ්‍යය | විෂයය |
|---|---|---|
| විද්‍යා විෂ්‍ය සඳහා සිංහල මාධ්‍යයෙන් පෙනී සිටින අයදුම්කරුවන් සඳහා | 2 | 34 |
| විද්‍යා විෂ්‍ය සඳහා දෙමළ මාධ්‍යයෙන් පෙනී සිටින අයදුම්කරුවන් සඳහා | 3 | 34 |
| විද්‍යා විෂ්‍ය සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පෙනී සිටින අයදුම්කරුවන් සඳහා | 4 | 34 |

අනුර එදිරිසිංහ
විභාග කොමසාරිස් ජනරාල්

Ers\Udara Asanka\es6.4\e2011\parani.newpad.doc